
# දෙස බස එළිකළ මිණිපහන - අහුබුදු



තරුණ අරිසෙන් අහුබුදු



18.03.1920 - 26.05.2011

දරුවෙකුට නැකතට අකුරු කියවන අහුබුදුවන්

ගුරුපියකු, කවියකු, ගීපබඳුවෙකු, ඉතිහාසවේදියෙකු, හෙළ හවුලේ අනුනයුවකු, නාට්‍යරචකයෙකු, නවකතා හා කෙටිකතාකරුවෙකු, පෙළපොත් රචකයෙකු, සඟරා සකසුවෙකු, ශබ්දකෝෂ සකසුවෙකු හා දේශකයෙකු, මෙන්ම හිතට එකඟව නිවැරදි හෙළ දැක්මක් අනුගමනය කළ ආදර්ශමත් ලක්පුතෙකු වූ අරිසෙන් අහුබුදු වියතාණෝ පසුගිය මැයි මස 26 වන දින උදයේ වසර 91 ක ආයුෂ කාලයකින් පසු අවසන් හුස්ම හෙළූහ. වචන වලින් නොව ක්‍රියාවෙන්ම හෙවත් කිරියෙන්ම දෙස බස රැස යන තෙරුවන නැංවීමෙහිලා සිය ජීවිත කාලය පුරාම පූර්ණ ශක්තිය යෙදවූ ඔවුන්ගෙන් අප දේශයට වූ සේවය අනූපමේයයි.

1920 මාර්තු මස 18 වනදා දකුණු ලක කොග්ගල, මලලගම, මුද්දල්ලගහවත්තේදී උත්පත්තිය ලද ආරියසේන ආශුබෝධයන් තම මූලික අධ්‍යාපනය ලැබුයේ කතලුව රජයේ පාසැලෙනි. (1923-1927) ගුරු පුහුණුව ලැබුයේ නිට්ටඹුව ගුරු අභ්‍යාස විද්‍යාලයෙනි. (1939-1942)

එවකට සිංහළ භාෂාවට නව පණක් දෙන අරමුණෙන් හෙළබස් ආරක් ඇරඹූ කුමාරණතුංග මුනිදාස වියතාණන්ගේ (1937-1944) හෙළහවුලට සමීපවූ ආශුබෝධයෝ කොග්ගල වෙල්ලාල ජයමහ (1936-1966) වියතාණන්ගේ සමීප ඇසුරත් නිසා තෙමේ ද එහි සාමාජිකයෙකු වූහ. ඒ අනුව එතුමෝ ආරියසේන ආශුබෝධ යන නම හෙළයට පෙරලා එතැන් පටන් මියෙනතුරා අරිසෙන් අහුබුදු යන නාමය භාවිතා කළහ.

එම නාමයට අප රටේ විශේෂ තැනක් හිමිවූ බව අපි කවුරුත් දනිමු. අරිසෙන් අහුබුදු යන්න අද්විතීය වන්නාසේ ම ඉන් කෂණික කව අප සවනට ඇසුණෝ මිහිරි වූත් අතිශය සරළවූත් නාමයකි. එසේම ඒ නම ඉමහත් දැනුම් සම්භාරයක් විහිදා දක්වන බවක් ද දැනිණ. ඒ සමගම එය රටට භාෂාවට හා ජාතියට නිසැක ඇල්මක් දක්වන කෙනෙකුගේ බව ද අප සිත් තුළ සනිටුහන් කළේය.

භාෂාව ගැන අහුබුදුවන් දැරූ මතය නම් නීතියෙන් තොර සමාජය බොල් නොහික්මුණු සමාජයක් වන්නාසේ ම වියරණ ව්‍යාකරන ආදියෙන් තොර භාෂාව ද වැදගැම්මකට නැත යන්න ය.

ගුරුවරයෙකු නොව ගුරුපියෙකු ලෙස එතුමෝ වසර 42 ක් (1937-1979) ආදර්ශමත් ලෙස ගුරුවෘත්තියෙහි යෙදුනාහ. නුවරඑළියේ හේලි ට්‍රිනිටි විදුහල, ගාල්ලේ මහින්ද විදුහල, කොළඹ මරදානේ මහා බෝධි විදුහල හා ගල්කිස්සේ ශාන්ත තෝමස් විදුහල දක්වා පාසැල්හි ගුරු තනතුර හෙබවූ අහුබුදුවන්ගෙන් නිවැරදි සිංහළ උගත් සිසු පිරිස් අතර ලංකාවේ විවිධ සමාජ මට්ටම්වල අය වෙති. සාන්ත තෝමස් විදුහලේ දී අහුබුදුවන්ගෙන් ලත් සිංහළ දැනුම අගයකළ අය අතර මහා නලු ගාමිණී පොන්සේකා ද වෙයි. අහුබුදුවන් ගැන ඔහුගෙන් සිංහළ උගත් බ්‍රෝහියර් නම් බර්ගර් ජාතික මහතෙකු ළඟදී ශ්‍රීලංකාවේ ඉංග්‍රීසි පුවත් පතකට ලියූ ඉතා මනරම් අගැයීමක් මම කියැවීමි.

ඔහුගේ තවත් විශිෂ්ඨ සේවයක් නම් නුදුටු සිසු දරුවන්ට භාෂාව හා පද්‍යරචනය තැපැලෙන් නොමිළයේ ඉගැන්වීමයි.

කවියෙකු ලෙස අරිසෙන් අහුබුදු මහතාණන්ගේ ප්‍රතිභාව තවත් කෙනෙකුට සමකළ නොහැකි තරම්ය. ගද්‍යයෙන් පවා පැහැදිලි කරන්නට අපහසු වියරණ ගැටළු හා අභිධර්මය ආදී දෙය පද්‍යයෙන් පැවසීම ඔහුට පහසු කාර්යයක් වීය. ඔහුගේ නිසග කවිත්වය නිසාම කුමාරතුංගයන් වෙතින් 1940 දීම කිවිපති යන බුහුමන පිදිණ. ඉන්පසු මහ කිවිපති හා මහ කිවිසුරු යන ගෞරවනාම ද ඔවුනට සමකාලීන විද්වතුන් ගෙන් ගලා ආයේ ය.

'පරෙවිය' කාව්‍යය (1961) අහුබුදුවන්ගේ ඉහළම පැදි කව සේ සැලකේ. එය සිංහළ සාහිත්‍යයේ මෙතෙක් ලියැවී ඇති දිගම සංදේශ කාව්‍යය වෙයි. එය ලෝක සාමය පතා ලියූවක් හෙයින් සෙසු සංදේශ කාව්‍යයන්ට වඩා පරෙවිය විශේෂත්වයක් උසුලයි.

අරිසෙන් අහුබුදුවන් ගී රචනා සඳහා යොදාගත් බස් වහර සිංහළ ශ්‍රාවක සිතට අමුතුම රසයක් දැනවීය. ඒ පද සරළ සුගම වීය. පහන් ගුණයෙන් අනූනය. පබඳා ඇති ගීත සංඛ්‍යාවද දහසකට ආසන්න ය.

ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් අධ්‍යක්ෂණය කළ **සංදේශය**, ටයිටස් තොටවත්ත නිර්මාණයකළ **කවුද හරි**, **අහළ පහළ**, **හඳයා** යන චිත්‍රපටවලට ඔහු ලියූ ගීත ජනප්‍රිය වීය.

සංදේශයේ පුරුතුගීසිකාරයා, කටේ කිරි සුවඳ යන්නට පවා බැරිවුණා, කෝ හතුරෝ කෝ හතුරෝ, පුන්සඳ එළියයි එන මඳ සුළඟයි, රැණගිරා රැණ අඹේ මී බිබී ආදී සියළුම ගී අහුබුදුවන් ගේ රචනාවෝ වෙති.

අහුබුදුවන් නවකතා හා කෙටිකතා රචකයෙකු ලෙසද අප දකින්නේ ඔහු ලියූ අසම්මතය රජවීම(1989) රන් කිරුළ (1985) යන ග්‍රන්ථ තුළිනි.

ඔහු ළමයින් සඳහාද කතා ලිවීය. නිවැරදි සිංහළ හුරුකරවනු පිණිස සැකැසූ පාසැල් පොත් පෙළක් ද වෙයි. 1947-1966 දක්වා 'එඩිය' නමින් සඟරාවක් ද එතුමෝ සංස්කරණය කළහ.

ඉහතකී සියල්ල මෙන්ම එතුමන් මුවින් ලංකාවේ දරුවන් දහස් සංඛ්‍යාවකට තබන ලද අර්ථවත් සරළ ආර්ය සිංහළ නම් කොපමණ වටනේද?

2007 වසරේ පෙබරවාරි මස මම ලංකාවට ගිය විට අහුබුදු වියතුන් හමුවන්නට ගල්කිස්සේ කලාපුර ඔවුන්ගේ නිවහනට ගියෙමි. මා කාර්යාල කාමරයට කැඳවා පැය බාගයකට වඩා කාලයක් මා වෙනුවෙන් කැපකළේය. ඒ මා එතුමන් හමුවූ දෙවන වරයි. පළ වෙනි වාරය 1972 දී බව මට මතකය. මේවර අහුබුදු මහතා කතා කළේ ලංකාවිත්ති පුවත් පත ගැනය. පිටරටක සිංහළ පත්‍රයක් ආරම්භකිරීම ගැන එතුමෝ මට ප්‍රශංසා කළහ. එසේම අප පුවත් පතේ 10 වන සංවත්සරය ළඟ එන බව කී විට ඒ මොහොතේම අගැයීම් ලිපියක් තම ලිපි ශිෂ්‍යයකම ලියා දුන්නේය. (එය අප 10 වන සංවත්සර කලාප යේ පළ විය) එසේම ලංකා විත්ති හා මගේ නමද අලලා කවියක් ද ලියූවේය. මට තේ පැන් සංග්‍රහයක්ද කළේය. එතුමන් ලියූ පොත්පත් ගණනාවක්ද ඔවුන් විසින් අඳින ලද බුද්ධ පින්තූරයක්ද මට දුන්නේය.

ඒ සියල්ල රැගෙන මා ලන්ඩනයට ආවේ ඉමහත් පහන් සිතිනි. හැමදේම අනිත්‍ය බැව් දන්නා නමුත් ඒ උතුමන්ගේ වියොව කිව නොහැකි තරම් පාඩුවකි.

♦ දයා ආනන්ද

# ලන්ඩනයේ ශ්‍රීලංකා මහා ක්‍රිකට් සැණකෙළිය

## Sunday 10th July 2011




# A lesson accurately taught

# පාඩමක් හරිහැටි ඉගැන්වීම

According to a recent news report, an International Education Institute in the country was recently faced with a unique problem...

A number of 18-year-old girls were beginning to use lipstick and would put it on in the bathroom. That was fine, but after they put on their lipstick, they would press their lips to the mirror leaving dozens of little lip prints.

Every night the maintenance man would remove them, and the next day the girls would put them back.

Finally the principal decided that something had to be done.

She called all the girls to the bathroom and met them there with the maintenance man. She explained that all these lip prints were causing a major problem for the custodian who had to clean the mirrors every night.

To demonstrate how difficult it had been to clean the mirrors, she asked the maintenance man to show the girls how much effort was required to clean.

He took out a long-handled mop, dipped it in the toilet, and cleaned the mirror with it.

Since then, there have been no lip prints on the mirror.

**There are teachers ... and then there are educators....**



එංගලන්තයේ එක් කාන්තා පාසැලක ඉගෙනුම ලබන 18 වියැති ශිෂ්‍යාවන් ලිප්ස්ටික් හෙවත් තොල් සායම් පාවිච්චි කරති. ඒකට කමක් නැත. නමුත් ඔව්හු බාත්රූම් කණ්ණාඩිය ඉදිරියේ තොල් පාටකොට අවසානයේ ඒ තොල් කණ්ණාඩියට තබා තදකර කණ්ණාඩියේ තොල් සටහනක් තබා යති. මෙවැනි සටහන් දවසකට සිය ගණනක් එකතු වෙයි. හවස බාත්රූම් එක පිරිසිදු කරන්නට එන සේවකයාට ඒවා පිරිසිදුකර ඉවරයක් නැත. පසුදා තව එවැනි සටහන් සිය ගණනකි.

බැරිම තැන පාසැලේ පාලකවරිය ශිෂ්‍යාවන් පිරිසද, පිරිසිදුකරන සේවකයා ද බාත්රූම් එකට කැඳෙව්වාය. ඇය ගැහැණු ළමයින් තබා යන ලිප්ස්ටික් පාරවල් නිසා ඒවා මකන්නට හැමදාම හවස පාසැලේ සේවකයාට දරන්නට වන වෙහෙස ඔවුනට පහදා දුන්නාය. එවෙලේද කණ්ණාඩියේ ලිප්ස්ටික් පාරවල් රාශියක් තිබුණි. ප්‍රින්සිපල්ගේ කතාව කෙල්ලන් පිරිස අසා ගෙන සිටියේ උවමනාවෙන් නොවේ. ඕනෑවට එපාවට ය.

ඉන්පසු ප්‍රින්සිපල් " මේ ළමයින්ට පේන්නත් එක්ක මේ කණ්ණාඩිය පිරිසිදු කරලා පෙන්නන්න....." යයි සේවක තරුණයාට කීවේ ය.

එවිට ඔහු බිම පිරිසිදු කරන කොස්ස හෙවත් මොප් එක ගෙන එය ටොයිලට් එකට ඔබා පොඟවා ඉන් කණ්ණාඩියේ වූ ලිප්ස්ටික් මාක් අතුල්ලා පිරිසිදුකර දැම්මේ ය.

එදායින් පසු යළිත් කිසිම දිනක ඒ පාසැලේ බාත්රූම් කණ්ණාඩිවල තොල් සායම් සටහනක් දැක්කේ නැත.

ගුරුවරු සිටිති. නමුත් ඉගැන්විය හැකි අය අඩු ය.

♦ කේසර මුදන්නායක
Milton Keynes UK